# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 390 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 07/03/2024 පැය 0745

## මාධ්‍ය නිවේදනය

**පහරදීමක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරියෙකු ඇතුළු සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - උඩප්පුව පොලිස් ස්ථානය.**

2024.03.05 වන දින රාත්‍රී කාලයේ උඩප්පුව පොලිස් වසමේ උඩප්පුව ප්‍රදේශයේදී උඩප්පුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනු ලබන උප පොලිස් පරීක්ෂකවරයෙකු හා ඔහුගේ මිතුරන් කිහිප දෙනෙකු සිවිල් පුද්ගලයින් දෙදෙනෙකු සමඟ ඇතිවූ බහින් බස් වීමක් හා පහරදී ගැනීමක් හේතුවෙන් උප පොලිස් පරීක්ෂකවරයා සහ ඉහත පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකු තුවාල ලබා ප්‍රථිකාර සඳහා උඩප්පුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රථිකාර සඳහා උප පොලිස් පරීක්ෂකවරයා පුත්තලම රෝහලටත් අනෙක් පුද්ගලයා හලාවත රෝහලටත් ඇතුලත් කර ඇත.

මෙම ගැටුම සිදුවන අවස්ථාවේදී උප පොලිස් පරීක්ෂකවරයා සමඟ එම ස්ථානයේ වැගන් ආර් රථයක තවත් සිවිල් පුද්ගලයන් කිහිපදෙනෙකු සිට ඇති බවට අනාවරණය වී ඇති අතර, එම රථයේ රියදුරු හා එහි සිට ඇති රථයේ හිමිකරු වැගන් ආර් රථය හා අදාල උප පොලිස් පරීක්ෂකවරයාට අයත් යතුරුපැදියක් ද සමඟ එදිනම රාත්‍රී උඩප්පුව පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 58 වයස් වල පසුවන උඩප්පුව හා කොත්තන්තිවු ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

2024.03.06 වන දින දහවල් කාලයේදී මෙම සිදුවීමෙන් තුවාල ලැබූ උප පොලිස් පරීක්ෂකවරයා ද පුත්තලම රෝහලේදී මුන්දලම පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් නිලධාරියා වයස අවුරුදු 33 ක් වන නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සිද්ධිය වූ ස්ථානයට හා උඩප්පුව රෝහල අසලට ප්‍රදේශවාසීන් පිරිසක් රැස්ව නොසන්සුන්කාරී තත්ත්වයක් හටගෙන තිබූ අතර, උඩප්පුව හා මුන්දලම පොලිස් ස්ථාන වල නිලධාරීන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කර ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් 2024.03.06 වන දින පුත්තලම ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු හඳුනා ගැනීමේ පෙරට්ටුවක් සඳහා ඉදිරිපත් කිරීමට 2024.03.07 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. සැකකාර උප පොලිස් පරීක්ෂකවරයා පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත මුදා හැර ඇත.

මෙම පහරදීමේ සිද්ධිය සම්බන්ධව හා ඉන් අනතුරුව ඇතිවූ නොසන්සුන්කාරී තත්ත්වය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු මුන්දලම පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**